ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

මිල කැඳවුම්පත් අංකය : CFHC/PD/SCR/HIK /2026/95

හික්කඩුව ධීවර වරායේ පරිහරණයෙන් ඉවත් කරන ලද අබලි භාණ්ඩ ඉවත් කිරීම සඳහා මිල ගණන් කැඳවීම

01. හික්කඩුව ධීවර වරායේ පරිහරණයෙන් ඉවත් කරන ලද අබලි භාණ්ඩ ඉවත් කිරීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් **2026.09.24** වන දින පෙරවරු 11.00 දක්වා සභාපති, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක: 15, රොක් හවුස් පටුමග, කොළඹ 15 විසින් කැඳවනු ලැබේ.

02. අබලි ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සඳහා කාර්යාලීය දිනයන්හි කාර්යාල වේලාවන් තුල පෙ.ව.9.00 සිට ප.ව. 3.00 දක්වා වරාය කළමණාකාර - හික්කඩුව ධීවර වරාය වෙතින් විමසීමෙන් පසුව සිදුකල හැක. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ **2026.09.23** වන දින ප.ව 3.00 දක්වා පමණි.

03. අදාල මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රිකා රු.1,000.00 ක ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් සහ රු.10,000.00 ක ආපසු ගෙවනු ලබන තැන්පතුවක් ගෙවීමෙන් පසු හික්කඩුව ධීවර වරායේ වරාය කළමණාකාර වෙත හෝ ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශය වෙත ලිපියක් ඉදිරිපත් කිරීමෙන් ලබාගත හැක.

04. මුද්‍රා තැබූ නිසි පරිදි පුරවන ලද පත්‍රිකා **2026.09.24** වන දින පෙරවරු 11.00 පෙර ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයේ ඇති ලංසු පෙට්ටියට බහාලීමට කටයුතු කලයුතුය. මිල ගණන් විවෘත කිරීම **2026.09.24** වන දින පෙරවරු 11.00 ට ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයේදී සිදු කරනු ලැබේ. එම අවස්ථාවට මිල ගණන් ඉදිරිපත් කල අයටද සහභාගි විය හැක.

05. මිල ගණන් විවෘත කිරීමෙන් පසු තෝරා ගනු ලැබූ අයට දැනුම් දෙනු ලබන අතර එසේ දැනුම්දීමෙන් පසු ඔවුන් විසින් නියමිත මුදල හික්කඩුව ධීවර වරායේ මුදල් භාරකරු වෙත මුදලින් ගෙවා රිසිට් පතක් ලබාගත යුතුය. ඉන් අනතුරුව අදාල ද්‍රව්‍ය කාර්යාලීය දින 07ක් ඇතුලත ඉවත් කරගත යුතුය.

06. තෝරාගත් අය විසින් අදාල මුදල් ගෙවා වහාම අදාල භාණ්ඩ ඉවත් කරගත යුතුය. එසේ ඉවත්කර නොගත් භාණ්ඩ පිළිබඳව ආයතනය විසින් වගකියනු නොලැබේ.

07. මිල කැඳවුම් පත්‍රයෙහි සඳහන් සෑම ලොට් අංකයන් සඳහා ඒ ඉදිරිපස ඇති කොටුවේ මිල ගණන් ඉදිරිපත් කල යුතුය.(ලොට් අංක 01 සිට 06 දක්වා)

08. මිල කැඳවුම් පත්‍රයෙහි සඳහන් අයිතම මිල ගණන් ඉදිරිපත්කල අයට ලබාදීම, මිල ගණන් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ කළමණාකාරීත්වය සතුය.

09. තෝරා ගනු ලැබූ අයට පිරිනමන ලද භාණ්ඩ ඉවත්කර ගැනීම ඉල්ලුම්කරුගේ වියදමින් සිදු කලයුතු අතර, සංස්ථාව විසින් මේ සම්බන්ධව කිසිවක් කිරීමට බැඳී නොසිටී.

10. **ගැණුම්කරුවන් තෝරා ගනු ලබන්නේ ඉදිරිපත් කර ඇති උපරිම මිල ගණන් වලට අනුවය. මිල ගණන් සඳහන් කල යුතු ආකාරය පිළිබඳව මිල කැඳවුම්පතෙහි 05 වන පිටුවේ අදාල ලොට් අංකයන්ට පහතින් සඳහන් කර ඇත.**

11. භාණ්ඩ ඉල්ලුම්කරු මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ලියවිල්ල සම්පූර්ණයෙන් පුරවා එවිය යුතු අතර අසම්පූර්ණ/ අපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. තෝරාගනු ලැබූ අයට පිරිනමන ලද භාණ්ඩ මුදල් ගෙවා කාර්යාලීය දින 07ක් ඇතුලත ඉවත්කර නොගතහොත් ඔබ විසින් ගෙවන ලද රු.10,000.00 ක තැන්පතු (ආපසු ගෙවනු ලබන) සංස්ථාව විසින් රඳවා ගනු ලබන බවත් කිසිම හේතුවක් නිසා එම මුදල් ආපසු නොගෙවනු ලබන බවත් අවධාරණය කරනු ලැබේ.

13. **මෙම ටෙන්ඩරය සඳහා ධීවර වරාය නීතිගත සංස්ථා සේවකයින් හට මිල කැඳවුම් ඉදිරිපත් කල නොහැක.**

සභාපති,
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක:15, රොක්හවුස් පටුමග,කොළඹ 15